# කොළඹ විශ්වවිද්‍යාලය
## ශාස්ත්‍ර පීඨය
### ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (අධ්‍යයන ධාරා) - දෙවන වසර
### සෙමෙස්තර අවසාන පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2018/2019
### DMG 2234 :ජනගහනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න** **කාලය: පැය දෙකයි (02)**

**මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ එක් පිටුවකින් (01) සමන්විත වේ**

---

1. අ) ජනගහනයක ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය කෙරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ශ්‍රම විභජනය (Labour division of gender) බලපානු ලබන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) දියුණු වෙමින් පවතින රටවල උපතේදී පුම්තිරි අනුපාතයේ ඇති අසාමාන්‍යය තත්වයන් ඇතිවීම කෙරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

2. ප්‍රජාවිද්‍යා සංරචකවල හැසිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අතර අන්තර් සම්බන්ධතාවය සුදුසු උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 20)

3. "ජනගහන ප්‍රතිපත්තීන් සකස් කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය ප්‍රායෝගිකව උපයෝගි කර ගැනීම මගින් කාන්තාවට සමාජය තුල සමාන තත්වයක් ඇති කළ හැකිය." ඔබ කැමති රටක් උදාහරණයට ගනිමින් මෙම කියමන විමසන්න.

(ලකුණු 20)

4. ඔබ කැමති තිරසාර සංවර්ධන ඉලක්ක හතරක් (04) තෝරාගෙන, එම ඉලක්කයන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පැතිකඩ විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

5. අ) ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (Gender-based violence) ජනගහනයක සමාජ-ආර්ථික සහ සෞඛ්‍යය ප්‍රතිවිපාක කෙරෙහි බලපාන ආකාරය විග්‍රහ කරන්න.

(ලකුණු 10)

ආ) ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ස්ත්‍රීවාදී එළඹුම්වල ප්‍රජාවිද්‍යාත්මක පැතිකඩ විග්‍රහ කරන ලද එළඹුම් පිළිබඳව විමසීමක් කරන්න.

(ලකුණු 10)